---

පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 05 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබද තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

රු. 1,307,788 ක වියදමක් දරා ගබඩා කාමරයක් ඉදිකර තිබුනද එහි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවිම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.112,931,937 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,468,767 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,309,935 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 3,906 | 2,583 | 313 |
| (ii) බදු කුලී | 2,634 | 2,784 | 67 |
| (iii) බලපත්‍ර ගාස්තු | 805 | 875 | - |
| (iv) වෙනත් ආදායම් | 8,054 | 12,840 | 7,569 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු. 8,300,000 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 6,000,000 |
| (ii) මුද්දර ගාස්තු | 2,300,000 |

### 2.2.3 පරිසර බලපත්‍ර

සභා බල ප්‍රදේශය තුළ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු ආයතන 11 ක් සඳහා එම බලපත්‍ර නිකුත් නොකිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු. 44,000 ක ආදායමක් සභාවට අහිමි වි තිබුණි.

---

2.2.4 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

නිසි සංවර්ධන බලපත්‍ර ලබානොගෙන සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු 06 ක් ඉදිකර තිබුණි. මෙම සභා බල ප්‍රදේශයට නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොවන බැවින් කුළුණු සඳහා අවසර ලබා දීමේදී සභාවේ අභිමතය පරිදි නිශ්චිත මුදලක් අයකර ගත හැකි වුවද ඒ සම්බන්ධව සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

2.2.5 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු. 268,211 ක් විය. බදුකරුවන් 106 දෙනෙකුගෙන් අයවිය යුතු වසරකට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින රු.121,081 ක් එහි ඇතුළත් විය.

2.2.6 ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු රු. 1,728,220 ක් වූ අතර ඒ තුළ අඩංගු, පාරිභෝගිකයන් 21 දෙනෙකුගෙන් අය විය යුතු වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින රු. 102,983 ක ගාස්තුවක් පැවතුණි.

2.3 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය